වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

**පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024**

**නර්තනය (දේශීය) - I**

කාලය පැය 02

විභාග අංකය :.................................

- අංක 1 සිට 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී නිවැරදි පිළිතුර තෝරා ඊට අදාල අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන් තුළ යොදන්න.

01. කොහොඹායක් කංකාරිය හා සමාජය සහ බලියාග පිළිවෙල යන කෘතීන් රචනා කර ඇත්තේ,
    1. තිස්ස කාරියවසම් මහතා සහ සරත් විජේවර්ධන මහතා ය.
    2. මුදියන්සේ දිසානායක මහතා සහ තිස්ස කාරියවසම් මහතා ය.
    3. මුදියන්සේ දිසානායක මහතා සහ සරත් විජේවර්ධන මහතා ය.
    4. ජයසේන කෝට්ටේගොඩ මහතා සහ තිස්ස කාරියවසම් මහතා ය.
    5. ජයසේන කෝට්ටේගොඩ මහතා සහ සරත් විජේවර්ධන මහතා ය. ( )

02. "බ්‍රහ්මේන්ද්‍ර මාධී මබිලං භුවනේසු භූතං......" යන ගායනය අයත් වන්නේ,
    1. සූවිසි විවරණ කවි වලටය   2. වරම් කවි වලටය
    3. නමස්කාර කවි වලටය   4. කඩතුරා කවි වලටය   5. කිරි ඉතිරවීමේ කවිවලටය

03. "රළලා, උපුලා, ලෙලුම තුලායා..........." මෙම කවිය අයත් වන්නේ,
    1) ගම්පොල යුගයේ ලියවුණු මයුර සංදේශයටයි
    2) ගම්පොල යුගයේ ලියවුණු තිසර සංදේශයටයි
    3) කෝට්ටේ යුගයේ ලියවුණු පරෙවි සංදේශයටයි
    4) කෝට්ටේ යුගයේ ලියවුණු සැලළිහිණි සංදේශයටයි
    5) කෝට්ටේ යුගයේ ලියවුණු මයුර සංදේශයටයි ( )

04. සිංහල ප්‍රශස්ති කාව්‍යයක් ලෙස පිළිගැනෙන "පැරකුම්බා සිරිත" රචනා වී ඇත්තේ
    1) පළමුවන පරාක්‍රමබාහු රජතුමා වෙනුවෙනි
    2) දෙවන පරාක්‍රමබාහු රජතුමා වෙනුවෙනි
    3) හතරවන පරාක්‍රමබාහු රජතුමා වෙනුවෙනි
    4) හයවන පරාක්‍රමබාහු රජතුමා වෙනුවෙනි
    5) තුන්වන පරාක්‍රමබාහු රජතුමා වෙනුවෙනි ( )

05. ගොග් ගොග් ජිං ජිංගත වට්ටමට අදාල තාල රූපය වන්නේ,
    1. දෙසුළු මහ තුන්තිත   2. දෙසුළු මැදුම් තුන්තිත
    3. සුළු මැදුම් දෙතිත   4. තුන්සුළු දෙමහ පස්තිත.   5. තුන්සුළු මහ සිව්තිත ( )

06. දොංතකු දොං ජිං ජිං ගත්තත් ජිං තත් තත් ජිං ජිං කඩතක මෙම අලංකාර බෙර පදය වාදනය කළ හැකි වන්නමකි.
    1) ගජගා වන්නම   2) උකුසා වන්නම   3) ගණපති වන්නම
    4) සුරපති වන්නම   5) මයුරා වන්නම ( )

07. වැදියකුන්, රුප්පායකුන්, මෙලෙයියකුන් පුදනු ලබන්නේ
    1) පහන්මඩු ශාන්තිකර්මයේදිය.
    2) කොහොඹාකංකාරි ශාන්තිකර්මයේදිය
    3) කිරිමඩු ශාන්තිකර්මයේදිය
    4) දෙවොල්මඩු ශාන්තිකර්මයේදිය
    5) රටයකුම් ශාන්තිකර්මයේදිය ( )

CamScanner

08. උඩරට මඟුල් බෙර වාදනයේදී "තරඟට [illegible]
කෙරෙනුයේ,
1) දේව පදයයි 2) ආශිර්වාද පදයයි 3) ගුරු පදයයි ( )
4) වට්ටම් පිරිමයි 5) පළමු වට්ටමයි

09. ගොප් කූරිය නමින් හඳුන්වනු ලබන්නේ,
1) පහන් පැල 2) යහන 3) ගොප්ගෙඩිය ( )
4) කිරි මැස්ස 5) තොරණ

10. රංග කාර්යයේදී නළුවා සභාවට අවතීර්ණ වීම සඳහා භාවිතා කරනු ලබන්නේ
1) නේපත්‍යාගාරයයි 2) කමතයි 3) වෙස් අත්තයි ( )
4) නානායම් පොළයි 5) නාට්‍ය ගෘහයයි

11. ලොව ප්‍රථම ස්ථිරව ගොඩ නගන ලද එළිමහන් කවාකාර රංග භූමිය ලෙස හැඳින්වෙන්නේ
1) රෝම රංග භූමිය 2) ග්‍රීසියේ එපිඩෝරස් රංග භූමිය ( )
3) එදිරිවීර සරච්චන්ද්‍ර රංග පීඨය 4) ග්ලෝබ් රඟහල
5) මරදාන ටවර් රඟහල

12. මණ්ඩම සහ හඬබෑය සම්බන්ධ කරන වරපටි ගෙතුම හැඳින්වෙන්නේ
1) ගැටිවැල ලෙසය 2) වලයම ලෙසය ( )
3) කොට්ට බිස්ස ලෙසය 4) කුන්දිරම්පල්ල ලෙසය
5) සුරත්තට්ටුව ලෙසය

13. විදුලි ආලෝකය සඳහා භාවිතා කරන ප්‍රධාන වර්ණ වන්නේ
1) නිල්, රතු හා කහ ය. 2) නිල්, රතු හා කොළ ය. ( )
3) නිල්, කහ හා දම් ය. 4) නිල් කොළ හා කහ ය.
5) නිල්, මැජෙන්ටා හා රතු ය.

14. යක්ඇනුම, කුවේණිඅස්න යන නර්තන අංග වලදී යක්දෙස්සෝ අතින් ගෙන නර්තනය කරනු ලබන්නේ
1) කාලපන්දම ය. 2) අත්පන්දම ය. 3) පොල්පන්දම ය.
4) විලක්කුව ය. 5) ඉටිපන්දම ය. ( )

15. පින්තූර රාමු වේදිකාවක ගගනිකාව ආලෝකමත් කරනු ලබන්නේ
1) ස්ට්‍රිප් ලාම්පුව මගිනි 2) ආලෝක තීව්‍රතා පාලකය මගිනි
3) අල්ට්‍රා වයලට් පහන මගිනි 4) පරිභ්‍රමණ මාන පහන මගිනි
5) ධාරාලෝක පහන මගිනි ( )

16. 14 වන ලුවී රජු ප්‍රථම වරට ඉදිකළ නර්තන පුහුණු පාසල නම් කරනු ලැබුවේ
1) ස්කැනියා ෆ්‍රොන්ස් නමිනි 2) ද ඇකඩමි රෝයල් ඩිලා ඩාන්ස් නමිනි
3) අඩියාර්හි කලාක්ෂේත්‍රය නමිනි 4) කේරල කලා මණ්ඩලම් නමිනි
5) විශ්ව භාරතී විශ්ව විද්‍යාලය නමිනි ( )

17. වේදිකාවේ භාවිතය සඳහා රංගාලෝකය ප්‍රක්ෂේපණය කිරීමේ විදුලි ලාම්පු හඳුන්වාදීමේ පුරෝගාමීන් ලෙස සැලකෙන්නේ,
1) ඇඩොල්ෆ් ඇපියා සහ ගෝර්ඩන් ක්රේග ය.
2) සෝමබන්දු විද්‍යාපති සහ රවි බන්දු විද්‍යාපති ය.
3) ෆිරිස්ට්ස්ට සහ ඩිරෝසෙල්මේයර් ය.
4) ස්ටාල් බෝට් සහ චෙකොව්ස්කි ය.
5) වොන් රොද්බාව් සහ දෙවෙනි හෙන්රි රජු ය. ( )

18. "දොඟර ජිං ජිං ගජිංත......" යන පද කොටස අයත් ශාස්ත්‍රීය නර්තනය වන්නේ
1) යක් ඇනුම 2) අස්නෙ 3) කොහොඹා හැල්ල
4) ආවැන්දුම 5) දුනු මාලප්පුව ( )

19. මණ්ඩි පද හා දොඹින පද නැටීමෙන් පසුව ආධුනිකයෙකු විසින් නටනු ලබන ප්‍රථම නර්තන අංගය වන්නේ
1) ශුද්ධ මාත්‍රය 2) මුල් මාත්‍රය 3) යක්පද මාත්‍රය
4) නඩන්දුව 5) ගෙජ්ජ මාත්‍රය ( )

CS CamScanner

20. ගත් දින් තත් දොම් තකු දොම්...... යන පදය හැඳින්වෙන්නේ

1) බරපදය නමිනි
2) අලංකාර පදය නමිනි
3) ඉරට්ටිය නමිනි
4) ආරම්භක පදය නමිනි
5) ආලාප්ති පදය නමිනි

( )

21. ප්‍රථම සිංහල සංදේශ කාව්‍යය ලෙස සැලකෙන්නේ,

1) කෝට්ටේ යුගයේ රචනාවූ තිසර සංදේශය යි
2) කෝට්ටේ යුගයේ රචනාවූ සැවුල් සංදේශය යි
3) ගම්පොල යුගයේ රචනාවූ තිසර සංදේශය යි
4) ගම්පොල යුගයේ රචනාවූ මයූර සංදේශය යි
5) කෝට්ටේ යුගයේ රචනාවූ පරෙවි සංදේශය යි

( )

22. බෞද්ධ මුහුණුවරකින් යුතුව දේශීය බලි ශාන්තිකර්මය මෙරට ප්‍රචලිත කිරීමේ පසුබිම ගොඩ නගන ලද්දේ

1. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසිනි
2. විදාගම මෛත්‍රී හිමියන් විසිනි
3. හතරවන පරාක්‍රමබාහු රජු විසිනි
4. කෝට්ටේ ධර්මපාල කුමරු විසිනි.
5. වෑත්තෑවේ හිමියන් විසිනි

( )

23. සතර දේවාල පෙරහැර මහනුවර ඇසළ පෙරහැරට සම්බන්ධ වී ඇත්තේ

1) කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේදිය
2) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ කාලයේදිය.
3) හයවන පැරකුම්බා රජුගේ කාලයේදිය.
4) හතරවන පරාක්‍රමබාහු රජුගේ කාලයේදිය
5) හතරවන බුවනෙකබා රජුගේ කාලයේදිය

( )

24. ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව බිහිවූයේ

1) වර්ෂ 1968 දී ය.
2) වර්ෂ 1972 දී ය.
3) වර්ෂ 1959 දී ය.
4) වර්ෂ 1956 දී ය.
5) වර්ෂ 1986 දී ය.

( )

25. 1877 වසරේදී ප්‍රථමයෙන්ම වේදිකා ගත කර ඇති බැලේ නාට්‍යය වන්නේ

1) නිදි කුමරිය ය.
2) ද නට් ක්‍රැකර් ය.
3) ජේසන් සහ රන් ලොම් බැටළුවෝ ය.
4) හංසවිල ය.
5) නල දමයන්ති ය.

( )

- අංක 26 - 35 දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න

26. ශ්‍රී ලංකාවේ මුද්‍රා නාට්‍ය කලාවේ වේදිකා පසුතල නිර්මාණකරණයේ විශිෂ්ට චරිතයක් ලෙස __________________ මහතා හැඳින්විය හැකිය.

27. උඩරට සොකරි නාටකයේදී ______________ රංග භූමිය ලෙස භාවිත කොට ඇත

28. "මේරුන් විරාජිත සමන් විහබුද්ධ රාජං" මෙය අනාඝාතාත්මකව ගයනු ලබන ________ ගායනයකි

29. දහඅට සන්නියේ රීරියකා පළඳිනු ලබන්නේ ____________ මුහුණට සමාන වෙස් මුහුණකි.

30. භරත නර්තනයේ වාද්‍ය වෘන්දයට වයලිනය එක් කරනු ලැබුවේ තන්ජාවූර් සහෝදරයෙකු වූ __________________ විසිනි.

31. මාතර ශෛලියේදී ලිවජවී නර්තනය ____________________ නැටුම යනුවෙන් හඳුන්වනු ලබයි

32. භරත නාට්‍යම් සංදර්ශනයක දක්නට ලැබෙන ඉතාම දීර්ඝවූත් අසීරුවූත් නර්තන අංගය වන්නේ _________________ ය

33. බැලේ රංග කලාව සඳහා පළඳිනු ලබන සපත්තු ____________ යනුවෙන් හඳුන්වයි.

CamScanner

34. රංග කර්මයක් ප්‍රේක්ෂකයන් ඉදිරියේ සිදු කරන ස්ථානය ........................ වේ.

35. [illegible] විසින් නිර්මාණය කරන ලද [illegible] ........................ යි.

36 - 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු තිත් ඉරි මත ලියන්න.

36. "දිය [illegible] ....." [illegible] ගුරු අක්ෂර හා ලඝු අක්ෂර [illegible]

ගුරු අක්ෂර ........................ ලඝු අක්ෂර ........................

37. මාත්‍රා 2+2+2+4+4 යන තාල රූපයට නර්තනය කළ හැකි උඩරට සහ සබරගමු නර්තන අංග දෙක නම් කරන්න.

උඩරට ........................ සබරගමු ........................

38. ලංකාවේ ප්‍රථම අංග සම්පූර්ණ ප්‍රොසීනියම් ආරුක්කු වේදිකාව පිහිටි වර්ෂය හා රඟහල කුමක්ද?

වර්ෂය ........................ රඟහල ........................

39. රුසියාවෙන් ලොවට දායාද කළ බැලේ නිර්මාණ ත්‍රිත්වයට සංගීත නිර්මාණයෙන් හා රංග වින්‍යාසයෙන් දායක වූ පුද්ගලයින් කවුරුන්ද?

සංගීත නිර්මාණය - ........................

රංග වින්‍යාසය - ........................

40. භරත නාට්‍යම් සම්ප්‍රදාය හා බැඳුණු ප්‍රධාන අවනද්ධ භාණ්ඩය හා තාල වාද්‍ය භාණ්ඩය නම් කරන්න.

අවනද්ධ භාණ්ඩය - ........................

තාල වාද්‍ය භාණ්ඩය - ........................

41. සිංහල ගැමි නාටකය හා සිංහල සැරසිලි කලාව යන කෘතීන් රචනා කළේ කවුරුන්ද,

1. ........................ 2 ........................

42. බුලත්පදය නර්තන අංගය ඉදිරිපත් කිරීමේදී ගනු ලබන රංග භාණ්ඩ දෙක නම් කරන්න.

1........................ 2 ........................

43. එක් අතක් උපයෝගී කරගෙන හා දෑතම උපයෝගී කරගෙන දක්වන මුද්‍රා හඳුන්වන නාමයන් මොනවාද?

1........................ 2 ........................

44. උකුසා වන්නමට සහ සුරපති වන්නමට අයත් තාල රූප දෙක ලියන්න.

1........................ 2 ........................

45. වෙස් මෝස්තර රචනයේ ප්‍රධාන අංග දෙක නම් කරන්න.

1........................ 2 ........................

CamScanner

46. භරත හා මනිපූරි නර්තන සම්ප්‍රදායන් සඳහා යොදාගනු ලබන සංගීත සම්ප්‍රදායන් නම් කරන්න.

1. භරත ........................................ 2. මනිපූරි ............................................................

47. බලි ශාන්ති කර්මයේදී බලි ඇදුරාගේ දකුණු අතට හා වම් අතට ගනු ලබන රංග භාණ්ඩ මොනවාද?

1. දකුණු අතට .................................. 2. වම් අතට ............................................................

48. ශාන්තිකර්ම සාහිත්‍යයට අනුව ප්‍රථමයෙන් යක්ෂ බියද දෙවනුව ................................................ ද

තෙවනුව ................................. ද ඇතිවූ බව කියවේ.

49. කුමාර පෙළපාළිය සහ කප්පු යක්කාරිය යන අංග දැකිය හැකි ශාන්ති කර්ම මොනවාද?

1. කුමාර පෙළපාළිය ............................................................

2. කප්පු යක්කාරිය ........................................................

50. ඇම්බැක්කේ දේවාලයේ කැටයම් සහ මහනුවර පෙරහැර පිළිබඳ දේශාටන වර්තා ඇසුරින් එකළ පැවති බව කිව හැකි ගැමි නැටුම් දෙක නම් කරන්න.

1 ................................................ 2 ........................................................................

CS CamScanner

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024

නර්තනය (දේශීය) - II

කාලය පැය 03

විභාග අංකය :.................................

I කොටස

- මෙම ප්‍රශ්න පත්‍රය I, II හා III වශයෙන් කොටස් තුනකින් සමන්විත වේ.
- I කොටසේ 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ.
- II හා III කොටස් වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න
- සෑම ප්‍රශ්නයකම I කොටසට ලකුණු හයක් ද II කොටසට ලකුණු 06 ක් ද III කොටසට ලකුණු 08 ක් ද වශයෙන් මුළු ලකුණු 20 බැගින් හිමිවේ.

1. I සුරපති වන්නමේ බෙරපදය අදාල තාල රූපයට ප්‍රස්තාර කරන්න.
   II "රන්විල පිදිදී විල කෙලිනා හිසවුන්ට" යන කවිපදය මැදුම් තනි තිතේ තාල රූපයට ප්‍රස්තාර කරන්න
   III ගොග් ගොග් ජිං ජිං ගත වට්ටමේ පළමු අඩවිව නියමිත තාල රූපයට අනුව ප්‍රස්තාර කරන්න.

2. ඓතිහාසික තොරතුරු විමසීමේදී ලාංකික නර්තන කලාව රාජ්‍ය අනුග්‍රහය මත වර්ධනය වී ඇති බව පෙනේ.
   I ගම්පල යුගයේ නර්තන කලාව කෙරෙහි බලපෑ භාරතීය ආභාසය සාධක 2 ක් ඇසුරින් පිරික්සන්න.
   II උඩරට වන්නම් බිහිවීම කෙරෙහි රාජ්‍ය අනුග්‍රහය ලැබුන ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න
   III අද්‍යතනයේ නර්තන කලාව හැදෑරීම සඳහා පාසල්වලට අමතරව උසස් අධ්‍යාපන ආයතනද බිහි වී ඇත. උදාහරණ හතරක් දෙමින් විස්තර කරන්න.

II කොටස

3. දේශීය ශාන්තිකර්ම විවිධ කලාංග වලින් සුපෝෂිත වේ.
   I සන්නියකුමේ එන සන්නි දෙකක රංග වස්ත්‍රාභරණ ඇසුරින් ඉහත කියමන සනාථ කරන්න
   II වලියක්මංගල්‍යය හා බැඳුණු චාරිත්‍ර විධි තුනක් නම් කර එහි අනන්‍යතා ලක්ෂණ පිළිබඳ ඇගයීමක් කරන්න
   III රට යකුමේ නාට්‍ය පෙළපාලි 3 ක් නම්කොට එහි සතර අභිනයේ උපයෝගීතාවය පිළිබඳව විමසුමක් කරන්න

4. සිංහල ශාන්තිකර්මවල අභිමතාර්ථයන් ඉටුකර ගැනීමේදී ගායනාවිදි, නාට්‍යමය පෙළපාලි, රංගභාණ්ඩ හා සැරසිලි ක්‍රමවල විශේෂතා දක්නට ලැබේ.
   I බලිශාන්තිකර්ම ගායනා තුනක් නම්කර ඉන් එක් ගායනා වර්ගයක් පිළිබඳ විස්තර කරන්න.
   II කිරිමඩු ශාන්තිකර්මයේ ආවේණික ලක්ෂණ, එහි එන නාට්‍යමය පෙළපාලි දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.
   III සන්නියකුම ශාන්තිකර්මයේ රංගභූමි සැරසිලි ක්‍රම පිළිබඳ උදාහරණ දක්වමින් විස්තර කරන්න.

CS CamScanner

5. ගැමි නැටුම් හා ගැමි නාටක වලින් ගැමියාගේ ආගමික සමාජීයිය හා ගැමි ජීවන රටාව පිළිබිඹු වේ.

I. ගැමි නැටුම් වලට අදාල ගායනා දෙකක් මගින් ගැමි ඇදහිලි හා විශ්වාස පිළිබඳව පැහැදිලි කරන්න.

II සිංහල හා දෙමළ ජන නැටුම්වල සංස්කෘතිකාංගවල සමානකම් ඇති බව ජන නැටුම් දෙකක් ඇසුරින් විමසන්න.

III ජස හා මුදලි කෝලම් චරිත නිරූපණය මගින් තත්කාලීන සමාජ අත්දැකීම් විවරණය කරයි. මෙම ප්‍රකාශය විචාරයට ලක් කරන්න.

6.

| A | B | C |
|---|---|---|
| තරානා | පුංගේ | පටාචාරා |
| ඨුම්රි | වෙන්ඩාව | හංසවිල |
| වර්ණම් | මෘදංගම් | නිදි කුමරිය |
| ගත් | තබ්ලාව | නට් කුකර් |
| පල්ටා | පඛවාජ් | මියැදෙන හංසයා |

I A කොටසින් භරත නාට්‍ය සම්ප්‍රදායට අයත් නර්තන අංගය තෝරාගෙන ඒ පිළිබඳ විස්තර කරන්න.

II B කොටසින් කථක් නර්තන සම්ප්‍රදායට අයත් ඉපැරණි වාද්‍ය භාණ්ඩය තෝරා ඒ පිළිබඳ හඳුන්වන්න.

III. C කොටසින් දේශීය මුද්‍රා නාට්‍යය තෝරාගෙන එහි රංගන දායකත්වය, පසුතල නිර්මාණය හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ ඇගයීමක් කරන්න

7. දේශීය නර්තන අංගවල ප්‍රාසාංගික බව වර්ධනයෙහි ලා විවිධ කලා අංගයන්ගේ දායකත්වය ලබා ඇත.

I දේශීය රඟ මඩලේ විකාශය සැකෙවින් දක්වන්න.

II නර්තනයක ප්‍රාසාංගිකත්වය උදෙසා චිත්‍ර කලාව දායක වන ආකාරය රංග වස්ත්‍රාභරණ සැකසුම් තුළින් පැහැදිලි කරන්න.

III රංග රචකයාගේ රංග වින්‍යාසයට අවනතව නර්තන ශිල්පියා විසින් නර්තනය ඉදිරිපත් කළ යුතුය. අදහස් දක්වන්න.

8. නූතන ජනමාධ්‍ය හා නර්තන කලාව අතර අන්‍යෝන්‍ය බැඳීමක් පවතින බව පෙනේ.

I රූපවාහිනී රියැලිටි වැඩසටහන් පාදක කොටගෙන සමාජ ගත වූ නිර්මාණාත්මක සංගීත ඛණ්ඩවල ගුණාත්මක භාවය පිළිබඳ කරුණු විමසන්න.

II නූතන ප්‍රාසාංගික නර්තන නිර්මාණවල එන චලන, සම්ප්‍රාදායික නිර්මාණ කලාවේ පැවැත්මට හානිකර වේ. අදහස් දක්වන්න

III ඓතිහාසික වටිනාකමකින් යුතුව බිහිවූ සිංහල චිත්‍රපට හා බැඳි නර්තන නිර්මාණ පිළිබඳ විමසීමක් කරන්න

CamScanner

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024

### නර්තනය - පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 1 - 2 | 6 - 4 | 11 - 2 | 16 - 2 | 21 - 3 |
| 2 - 3 | 7 - 2 | 12 - 4 | 17 - 1 | 22 - 2 |
| 3 - 1 | 8 - 2 | 13 - 2 | 18 - 4 | 23 - 1 |
| 4 - 3 | 9 - 4 | 14 - 3 | 19 - 2 | 24 - 5 |
| 5 - 5 | 10 - 3 | 15 - 1 | 20 - 1 | 25 - 4 |

26 - සෝමබන්දු විද්‍යාපති මහතා

27 - කමත

28 - නමස්කාර

29 - වාලි

30 - වඩිවේළු

31 - සුවඳමල් අමාත්‍යාගේ

32 - වර්ණම්

33 - ස්කල්ෆෙ

34 - රංග භූමිය

35 - මෘදාංගය

36 - ගුරු 04 ලඝු 12

37 - මංගලම් - මුල් මාත්‍රය

38 - 1911 - මරදාන ටවර් රඟහල

39 - පීටර් චෙයිකොව්ස්කි - මාරියස් පෙටිපා

40 - මෘදාංගය - නටුවාංගම්

41 - එදිරිවීර සරච්චන්ද්‍ර මහතා - ලයනල් බෙන්තරගේ මහතා

42 - බුලත් අත - සළුව

43 - අසම්යුත - සම්යුත

44 - 1. මාත්‍රා 4 තාලරූපය (මහ තනි තිත)
2. මාත්‍රා 3 + 4 තාලරූපය (මැදුම් මහ දෙතිත)

45 - 1) අංග රචනය - 2) රංග වස්ත්‍රාභරණය

46) - 1) දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීත සම්ප්‍රදාය
2) උත්තර භාරතීය හින්දුස්ථානී සංගීත සම්ප්‍රදාය

47- 1) පන්දම 2) අත්මිණිය /වජ්‍රාමිණිය/ගායනය

48- 1) රෝගභය - අමනුෂ්‍ය භය

49- 1) සන්නියකුම / දහඅට සන්නිය
2) රට යකුම / රිද්දියාගය

50- 1) ලී කෙලි
2) කළගෙඩි නැටුම

## II කොටස

01. i

| ∧ | / | ∧ | / |
|---|---|---|---|
| 1 2 3 | 1 2 3 4 | 1 2 3 | 1 2 3 4 |
| ද්‍රෝං - - | ජිං - ජිං - | ත ක ට | දොං - ත ක |

II

| / | / | / | / |
|---|---|---|---|
| 1 2 3 | 1 2 3 | 1 2 3 | 1 2 3 |
| + රන් විල | රිද් - දි | + විල කෙ | ළි නා - |
| + බිස වු | න් ට - | - - - | - - - |
| + මැ ණික් | වි ලේ - | + දිය නා | - ලා - |
| + ගොඩ එ | න් ට - | - - - | - - - |

III

| ∧ | ∧ | ∧ | / |
|---|---|---|---|
| 1 2 | 1 2 | 1 2 | 1 2 3 4 |
| ජේ හිං | ත කු | ත ක | ජි ජි කු ද |
| ගුත් - | ජිත් - | තත් - | කුං - දිං - |
| ත ක | ජිත් - | තක් - | කුං - දිං - |
| ග ජිං | - ත | ග ජි | ත කු දිං - |
| ජි ජිං | - ත | ජි ජි | ත කු දිං - |
| තක් කඩ | ජික් කඩ | දොං ගඩ | තරි කිට ජිත් - |
| තරි කිට | ජික් කඩ | දොං ගඩ | තරි කිට ජිත් - |
| දොද් දොං | තරි කිට | දොං ගඩ | තරි කිට කු ඳ |
| ගුජ් - | ජි ජි | ග ත | කු ඳ ග ත |
| ග ත | දොද් - | දොං - | දො දොං - ත |
| දොං ගඩ | තරි කිට | ජිත් - | තා - - - |
| ගුත් - | ත කු | ජිත් - | තා - - - |
| ග ජි | ත කු | ජිත් - | තා - - - |
| ගුත් - | ජිත් - | ත ක | දො මි කි ට |
| දොං ගඩ | තරි කිට | ජිත් - | තා - - - |

I සහ II සඳහා නිවැරදි තාල සංඥා සහ ආවර්ත බෙදිමට ලකුණු 02
නිවැරදි ප්‍රස්ථාරයට ලකුණු 04
III කොටසට නිවැරදි තාල සංඥා සහ ආවර්ත බෙදීමට ලකුණු 02
නිවැරදි ප්‍රස්ථාරයට ලකුණු 08

2 ඇම්බැක්ක දේවාලය ලී කණුවල ඇති සිව්රැක් පනේලයක නළඟන රුව දැක්වෙන නර්තන විලාශය දකුණු ඉන්දීය ලක්ෂණ පෙන්නුම් කරයි

එහි මංඩියට සිටින ඉරියව්වෙහි එක් පාදයක් පූර්වයටද අනෙක් විළඹ තබා තිබීම
තිසර සංදේශයේ එන කව්වල භාරතීය ලක්‍ෂණ සඳහන් වන බව
උදා :-

II වීර පරාක්‍රමබාහු නරේන්ද්‍රසිංහ රජු මදුරාපුර නායක්කර් වංශික කුමරිය සරණ පාවා ගැනීම නිසා සිදුවූ කලාවේ ප්‍රබෝධය

නරේන්ද්‍රසිංහ රජුට කොහොඹා කංකාරියක් පැවැත්වූ බව සඳහන් වන බව

කවිකාර මඩුවේ රජුගේ විනෝදය උදෙසා ගායන, වාදන හා සංගීතය පැවැත්වීම

කවිකාර මඩුවේ ගායනය කිරීම සඳහා වන්නම් බිහිවූ බව
රජමාළිගාව ආශ්‍රිතව ඉලංගම් නැමති සංවිත පහක් බිහිවීමට රාජ්‍ය අනුග්‍රහය ලැබීම

III 1936 විල්මට් ඒ පෙරේරා මහතාගේ කැපවීම මත හොරණ ශ්‍රී පාලිය බිහිවූයේය
1952 රජයේ ලලිත කලායතනය බිහි වීම වූ බව
1956 සංස්කෘතික දෙපාර්තමේන්තුව ආරම්භය හා පිළිගත් නර්තන අධ්‍යාපන ආයතනය බවට පත් වූ බව
1972 ගිරාගම ගුරු විදුහල බිහිවීම
1974 කැලණි විශ්ව විද්‍යාලයට අනුබද්ධ සෞන්දර්ය අධ්‍යාපන ආයතනය ආරම්භ වූ බව
1986 දී ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන ආයතනය ආරම්භ වූ බව
2005 සෞන්දර්ය විශ්වකලා විහව විද්‍යාලය නමින් ස්වාධීන විශ්ව විද්‍යාලයක් බිහිවූ බව

03

I

- සන්නි දෙකක් නම් කර තිබීම.
- සන්නි දෙකක රංගවස්ත්‍රාභරණ පිළිබඳ විස්තර කර තිබීම
  උදා - බිහිරි, ගොළු, කණ වැනි සන්නිය ඇසුරින් දක්වා තිබීම
- මරු සන්නිය තද කළු වර්ණයෙන් සැරසී සිටීම හා මුහුණු කළු කර ඇති බව
- සන්නි චරිත භාවපූර්ණ කිරීම සඳහා වෙස් මුහුණු භාවිතා කරන බව
  ආදී ලෙස රංගවස්ත්‍රාභරණ ඇසුරින් කරුණු 03 ක් දක්වා ඇත්නම්

ලකුණු 2 + 4 = 6

II

- කාලියාම, ගරායකුම නැටීම, ගුරුගේ මාලාව, ආවැන්දුම දොගර ජීං ගජීං ජීංගත වට්ටම්,
- කීල බැඳීම වැනි චාරිත්‍ර ඉදිරිපත් කිරීම

තේවා වාදනය සමග පූජා චාරිත්‍ර ආරම්භ කිරීම

පරහඳ ගැමෙන් පසු වලියක් මංගල්‍ය ආරම්භ කිරීම

පළමු දිනයේ සිට 7 වන දිනය දක්වා නියමිත වේලාවන් අනුව තේවා හේවිසි වාදනය ආරම්භ වේ

- ගවර මල වටා මඩුපුරය හා මල් හත් පදය පමණක් නර්තනය කිරීම
- කොහොඹාකංකාරියේ එන යක්කම්වලින් ඌරා යක්කම් පමණක් රඟ දක්වන්නේ නැත

III

- නානු මුරය
- කපුයක්කාරිය
- දරු නැලවිල්ල
- ඉහත නාට්‍යමය පෙළපාලි අවස්ථා සඳහා සතරඅභිනය උපයෝගී කොට ගෙන ඇති බව
- නෘත, නෘත්‍ය, නාට්‍ය කොටස් වලින් යුක්ත බව
- යකැදුරා විවිධ අවස්ථාවල ඒ ඒ චරිත වලට සමාරෝපය වන බව
  ආදී ලෙස නාට්‍යමය අවස්ථාවල සතර අභිනය උපයෝගීකොට ගෙන ඇති ආකාරය විස්තර කර ඇත්නම්

ලකුණු 08

04 I අෂ්ඨක, ග්‍රහපන්ති, සිරසපාද, කඩතුරා, බලි මඩුපුරය, හිං හතර යන කවි ගායනා වර්ග නම් කිරීම

- ඉහත කවි වර්ගයක් විස්තර කිරීම

- උදාහරණ ලෙස කවියක් ලියා විස්තර කිරීම

II සබරගමු නර්තන සම්ප්‍රදායේ ගව පට්ටි සංරක්ෂණය සඳහා කරනු ලබන ශාන්තිකර්මයක් බව

- නාට්‍යමය පෙළපාලි ලෙස "නුගේ හැල්ල, මී කැඩීම, ඇත් බන්ධනය, මී බන්ධනය සිදු කරනු ලැබේ
- සාම්ප්‍රදායික අනන්‍යතා ලක්ෂණ

- රංග සැරසිලි, රංග උපකරණ/මල් යහනාව/කිරිමැස්ස

- නාට්‍යමය රංගන අවස්ථා තුළ ඇති ග්‍රාමීය ලක්ෂණ පෙන්නුම් කර තිබීම

III

සැරසිලි

සන්නි යකුන් වීදිය, මල් යහන, පිදේනි ගොටු, සන්නි කුඩුව, කන් තිරික්ක යන සැරසිලි භාවිතා කරයි

පරිසරයෙන් සපයා ගන්නා අමුද්‍රව්‍ය භාවිතා කිරීම

05 I වරම් වරම් ඉර සඳ දෙවි අතින් වරම්

බෝ අත්තට වැඳ සිරස නමන්නේ

හිරු දෙවියන්ගේ ඉර ගල ගාවා

ලොව සෙත් කරවන පත්තිනි සදිනේ

ඉහත නම් 02 ක් ලියා ජන ජීවිතයෙහි ඇදහිලි හා විශ්වාස මත ගායනා හා ගැමි නැටුම් නිර්මාණය වී ඇති බව

II

- සිංහල ගැමි නැටුම් → ලී කෙළි කළගෙඩි කුළු ගොයම්
- ද්‍රවිඩ ගැමි නැටුම් → කෝලාට්ටම්, චෙම්බු, සුලකු, අරිවුවෙට්ටු

මෙයින් ජන නැටුම් 02 ක් තෝරාගෙන සමානකම් පිළිබඳ විමසීමක් කර ඇත්නම්

ලකුණු 06

III මුදලි

- ප්‍රභූ පන්තිය නියෝජනය කරන බව
- රාජකාරිය පැහැර හරින බව
- උඩගුකම හා මාන්නාධික බව
- සුරාවට ලොල් වූ චරිතයක් බව
- අසාධාරණ ලෙස තීන්දු තීරණ ලබා දෙන චරිතයක් බව

ජසයා

- කුලහීන පන්තිය නියෝජනය කරන බව
- සුරාවට ලොල් වීම නිසා අකටයුතුකම් සිදුවන බව
- අඹුසැමි සබඳතාවන්හි ඇති සම්බන්ධතා පවුල් සංස්ථාවේ ඇති නොසන්සුන් බව
- බහු විවාහකයෙකු බව

- උඩගුකම ආත්ම වර්ණනාව චරිතය තුළින් දිස්වන බව

උදාහරණ සහිතව ඉහත තොරතුරු වලින් කරුණු 04 ක් විස්තර කර ඇත්නම්

ලකුණු 08

06 I වර්ණම්

- භරත නාට්‍යම් සංදර්ශණයක දක්නට ලැබෙන දීර්ඝතම වූත් අසීරුතම වූත් නර්තන අංගය බව
- නෘත, නෘත්‍ය, නාට්‍ය යන ලක්ෂණ ත්‍රිත්වයෙන්ම සමන්විත බව
- භරත නාට්‍ය නර්තන ශිල්පියාගේ හෝ ශිල්පිණියගේ දක්‍ෂතාව මැන බැලෙන අංගයක් බව%
- භාව ප්‍රකාශනයෙහි දක්ෂතාව, අංග චලනයන්හි ශුද්ධ බව, සංකීර්ණ ලය හා තාල මත පිහිටා නැටීමේ හැකියාව ලැබෙන බව
- නර්තනය කිරීමේ ඇති ශ්‍රම ශක්තිය, දරාගැනීමේ හැකියාව මෙන්ම නර්තනය පිළිබඳ ගැඹුරු අවබෝධය මෙම නර්තන අංගයෙන් ප්‍රකට කෙරෙන බව
- ජති කොටසකින් අරඹා ජති කොටසකින්ම අවසන් කරන බව
- ගැයෙන ගීත ඊෂ්වර හා ක්‍රිෂ්ණගේ වර්නනාවන් බව

කරුණු තුනක් වත් පැහැදිලි කර ඇත්නම්

ලකුණු 06

II පක්වාජ්

- මෝගල් සමයේ කතක් නර්තන සම්ප්‍රදාය හා බැඳි ප්‍රධාන අවනද්ධ භාණ්ඩය බව
- පක්වාජ් යන්නෙහි අර්ථය නිර්මල ධ්වනිය වන බව
- මැද මහත්වන සේ දෙකෙලවර කුඩාවී යන අයුරින් ලීයෙන් තනා ඇති බව
- දෙඇස ප්‍රමාණයන් දෙකකින් යුක්ත බව
- දකුණු දෙඇසෙහි විෂ්කම්භය අඟල් 06 - 07 ක් පමණ වන අතර එහි මධ්‍ය නිත්‍ය බදාමයකින් පූර්ණව පවතින බව
- වම් ඇසෙහි ප්‍රමාණය ඊට වඩා විශාල වන අතර විෂ්කම්භය 09 - 11 ක ප්‍රමාණයකින් යුක්ත වන බව
- මෙම බෙර ඇසෙන් ගාම්භීර හඬක් නිකුත් වන අතර අනික් බෙර ඇසෙන් තියුණු හඬක් නිකුත් වන බව
- බෙර දෙඇස හම්වලින් සම්බන්ධ කර ඇති අතර එහි මැද කුඩා ලී කැබලි එහා මෙහා කිරීමෙන් නාදයෙහි උස් පහත් බව පහත් කර ගත හැකි බව

කරුණු 04 ක් පමණ විස්තර කර ඇත්නම්

ලකුණු 06

III පටාචාරා

- ජානකී හිල් මහත්මියගේ අධ්‍යක්‍ෂණයෙන් බිහිවූ බව
- අරකවල නර්තන හා නාට්‍ය පදනමින් ශිල්පිනියන් 120 දෙනෙකු සහ පරිබාහිර ප්‍රවීණ කලා ශිල්පීන් රැසකගේ දායකත්වය ලබා ඇති බව
- රංගභූමි නිර්මාණයට පසුබිම් වන පරිසරය සඳහා යොදා ගැනෙන පසුතල වරෙක මාලිගාවක් ලෙසද වරෙක ආශ්‍රමයක් ලෙසද වෙනස් වන පරිදි සකසා ඇති බව
- සිටුතුමා, සිටුදේවිය, තාරාකුමරිය, කුමරියගේ යෙහෙළියන් සඳහා ඉන්දියාවෙන් ගෙන්වන ලද රංග වස්ත්‍රාභරණ භාවිතා කර ඇති බව

ආදී ලෙස කරුණු උදාහරණ සහිතව ඇත්නම්

ලකුණු 08
මුළු ලකු 20

07 I

- කමත
- තානායම් පළ
- කරලිය
- පිංතූර රාමු වේදිකාව

විස්තර කර ඇත්නම් ලකුණු 06 යි

II විවිධ සම්ප්‍රදායික ඇඳුම් කට්ටල සම්ප්‍රදායන් තුනටම හඳුන්වා දී ඇති බව
වර්ණ, රේඛා හැඩතල, හා චිත්‍ර කලාවේ මූලිකාංග රංග වස්ත්‍ර නිර්මාණයට යොදා ගන්නා බව
ලා වර්ණ වැඩිපුරා යොදා තද වර්ණයකින් මතුකර දැක්වීමෙන් ප්‍රාසාංගික බව තීව්‍ර වන බව
පෙරබිම, මැදබිම, පසුබිම සංකල්පයට අනුව රංග වස්ත්‍ර නිර්මාණය කර තිබීම

ආදී ලෙස අදාල කරුණු 03 ක් ඇත්නම්

ලකුණු 06

III පුද්ගලයෙකු කුඩා අවධියේ සිට නර්තන විෂය හැදෑරීම අරඹන බව
විධිමත් පුහුණුවකින් අති දක්ෂ ශිල්පියෙකු වන බව
කොපමණ දක්ෂ ශිල්පියෙකු වුවද නර්තන රචකයාට අවැසි පරිදි තම රංගන දායකත්වය ලබා දිය යුතු බව
මෙහිදී අනවශ්‍ය කැපී පෙනීමකට උත්සහ නොකළ යුතු බව
නර්තන රචකයාගේ උපදෙස් වලට අවනතව නිර්මාණය කළ යුතු බව

ආදී ලෙස ගැලපෙන කරුණු 04 ක් දක්වා ඇත්නම්

ලකුණු 08

මුළු ලකුණු 20

08 I රියලිටි වැඩසටහන් නම්කර තිබීම

- අද ජනප්‍රියත්වයට පත්ව ඇති සංගීත බණ්ඩවලට ඉදිරිපත් කරන නර්තනවල ගුණාත්මකභාවයේ ස්වභාවය දක්වා තිබීම
- සමාජය අද සම්ප්‍රදායෙන් බැහැරව නිර්මාණ කරනයට යොමුවන බව
- නොගැලපෙන සංගීත වලට පවා නර්තන ඉදිරිපත් කරන බව

ආදී ලෙස ගැලපෙන කරුණු 03 ක් දක්වා ඇත්නම්

ලකුණු 06 යි

II

- නූතන ප්‍රාසාංගික නර්තන නිර්මාණ වල චලන විවිධාකාර වන බව
- විවිධ විදේශීය නර්තන සම්ප්‍රදායන්ගේ ආභාෂය ලබා ඇති බව
- නූතන නර්තන නිර්මාණ වල චලන බටහිර බැලේ නර්තන ශෛලියේ ආභාෂය ලබා ඇති බව
  උදාහරණ - ඉහල තලයේ පැණීම්, කැරකීම්, පාද එසවීම් ආදිය
- විවිධ නර්තන ඉරියව් නූතනයේ එක්වී ඇති බව

ආදී ලෙස කරුණු 03 ක් වත් දක්වා ඇත්නම් ලකුණු 06 යි

III

- ඉන්දියානු සිනමා කර්මාන්තය නර්තන කලාව මූලික කොටගත් එකක් බව
- ඒවායේ සංගීතයට සාපේක්ෂව ප්‍රබල රසවින්දන මාධ්‍යයක් ලෙස නර්තනයද යොදා ගන්නා බව
- එකී ඉන්දියානු භාවිතයන් ලංකාවේ චිත්‍රපට වලටද බලපා ඇති බව
- දේශීය සිනමාව නූතන චිත්‍රපට සඳහා බහුලව නර්තන නිර්මාන යොදාගෙන ඇති බව
  උදාහරණ - කුස පබා, පත්තිනි, යශෝදරා වැනි චිත්‍රපට
- අවස්ථා නිරූපණයේදී මෙන්ම භාවෝද්දීපණ සිද්ධි නිර්මාණයේදී නර්තනය හා සංගීතය මනාව සුසංයෝග කොට ඇති බව

ආදී ලෙස ගැලපෙන කරුණු 04 ක් දක්වා ඇත්නම්

ලකුණු 08
මුළු ලකුණු 20